09

# ධීරට සම්මානයක්





**සති අන්තයේ පළවුණු පුවත්පතක් කියවමින් සිටි පියා එහි ඇතුළත් සුවිශේෂී පුවතක් පිළිබඳ ව සිය කුඩා පුතුගේ අවධානය යොමු කරවයි. පුතා එය හඬ නගා කියවයි.**

දිනය පසුගිය 24 වන ඉරිදා ය. වැලිපොත දඹවින්න විදුහලේ උත්සවයක් පැවැත්විණි. ඒ ජීවිත තුනක් බේරා ගැනීම වෙනුවෙන් පැවැත්වුණු උපහාර උත්සවයකි. උපහාර ලැබුවේ මෙම විදුහලේ පස්වන පන්තියේ ඉගෙන ගන්නා ධීර සම්පත් නම් කුඩා ශිෂ්‍යයෙකි.

විදුහල්පතිතුමා ධීර ශිෂ්‍යයා කැඳවා සභාවට හඳුන්වා දුන්නේ ය. මෙහි දී ඔහුට වීර සම්මානයක් හිමි විය. එය පිරිනමන ලද්දේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා විසිනි. මෙම ශිෂ්‍යයා වෙනුවෙන් රුපියල් ලක්ෂයක් තැන්පත් කරන ලද බැංකු පොතක් ග්‍රාමීය බැංකු කළමනාකාරතුමා ධීරට ප්‍රදානය කළේ ය. නිවාස සංවර්ධන අධිකාරිය විසින් නව නිවසක් ද, වැලිපොත ප්‍රාදේශිය සභාව විසින් ඔහුගේ අධ්‍යාපන කටයුතු සඳහා විශේෂ ශිෂ්‍යත්වයක් ද පිරිනමන ලදි. එහි පැමිණි සියලු දෙනාගේ ම ඉමහත් ප්‍රශංසාව ධීරට හිමි විය.

ධීරගේ නිවස අසල වෙල්යායකි. වෙල කෙළවර මහවැලි ගඟ ය. ඔහු නිවාඩු දිනවල යහළුවන් සමග ගඟේ පිහිනීමට යයි. ඔහු පිහිනීමට සමතෙකි. දිය උඩින් සහ දිය යටින් පීනයි. උඩු අතට සහ යටි අතට පීනයි. දිය පාගයි. දිය පෑගීම ද හොඳ ක්‍රීඩාවකි. බිම අඩිය නොතබා දිය මත ටික වේලාවක් සිටීම දිය පෑගීමයි. ඔහු කියන්නේ මෙය බයිසිකල් පැදීම වැනි ක්‍රියාවක් බවයි.

ධීරගේ තාත්තා ගමේ හොඳ ගොවියෙකි. ඔහු දිනපතා උදේ ම එළදෙන හා පැටියා තණකොළ කෑමට ගඟ අයිනේ බඳියි. ධීර හවසට හරකුන් ගෙදරට දක්කාගෙන එයි.

එදින සවස සිරිත් පරිදි ධීර එළදෙන දක්කාගෙන ඒමට ගඟ දෙසට ගියේ ය. ඔහු ගං ඉවුර දිගේ එන විට හදිසියේ ම කාන්තාවකගේ කෑගැසීමක් ඇසුණේ ය. ඔහු වහා ගඟ ළඟට දිව්වේ ය. මේ ගඟේ මිනිසුන් නාන හරියේ ම "ආඥාවළ" නමින් ලොකු වළක් තිබේ. ආඥාවළට වැටුණොත් නැවත ගොඩ ඒමක් නැති බව මිනිස්සු කියති. එය ඒ තරම් ම ගැඹුරුයි.

කටහඬ ඇසුණේ ආඥාවළ දෙසිනි. ඔහු වහා ඒ දෙසට දිව ගියේ ය. හේනෙගෙදර ආච්චි ආඥාවළ ආසන්නයේ සිට කෑගසයි.

"අනේ පුතේ පොඩි දූ ඔය ගල උඩ සෙල්ලම් කළා. එක පාරට ම ලිස්සල වළට වැටිලා. එයා ගොඩ ගන්න පොඩි පුතාත් පැනලා."

ආඥාවළේ ගැඹුරු හරියේ පෙණ මතු වෙමින් තිබිණි. පෙණ මතුවෙන තැන බලා, ධීර ඇඳ සිටි ඇඳුම් පිටින් ම වහා ආඥාවළට පැන්නේ ය. ඔහු දිය යටට කිමිදුණේ ය. ඔහුට අතක් හසු විය. දියේ ගිලුණු පිරිමි ළමයා පිට උඩ තබාගෙන ධීර ගොඩට පීනුවේ ය. ඔහු ගොඩ තබා සැණෙකින් ධීර නැවත කිමිදුණේ ය. අනෙක් ළමයාගේ හිසකේ රොදක් අතට හසු විය. ඒ ළමයා ද පිටේ තබාගෙන ධීර ගොඩට පීනුවේ ය. ආච්චි පෙනෙන්නට නැත. වට පිට බලන විට ඇය ද ගඟට වැටී ආඥාවළ අසල පඳුරක එල්ලී කෑගසමින් සිටියා ය. ධීර වහා ආච්චි ද ගොඩට ගත්තේ ය.



ධීරට පාසලේ දී කියා දුන් ප්‍රථමාධාර පාඩම මතක් විය. ඔහු තිදෙනාගේ ම නාසයේ කටේ හිර වී තිබුණු අපද්‍රව්‍ය ඉවත් කළේ ය. එක් එක් අයගේ කටට තමාගේ කට තබා හුස්ම ගැනීමට සැලැස්වී ය.

ධීර ගෙදර නොපැමිණි නිසා අම්මාත්, තාත්තාත් ඔහු සොයා පැමිණියහ. අම්මාත්, තාත්තාත් එනු දුටු ධීර කෑගැසුවේ ය. ඔවුහු වහා ඒ දෙසට දිව ආහ. පුංචි ධීර ජීවිත තුනක් බේරා ගැනීම ගැන ඔවුහු පුදුමයට පත් වූහ. තාත්තා ඈත කුඹුරේ වැඩ කරමින් සිටි තව කීප දෙනකුත් සමග මේ තිදෙනා ම රෝහලට ගෙන ගියේ ය. ධීර ද ඔවුන් සමග රෝහලට ගියේ ය. ප්‍රතිකාරවලින් පසු තිදෙනා ම සුවපත් වූහ. දොස්තර මහතා පුංචි ධීර ගැන අසා බොහෝ සතුටු විය. "මෙබඳු පුතුන් අපේ රටට මහත් ආඩම්බරයක්" යයි කියමින් දොස්තර මහතා ධීරගේ හිස අත ගෑවේ ය. ජීවිත බේරා ගත් පුංචි නංගීත්, මල්ලීත්, ආච්චිත් ධීර සිප වැළඳ ගත්හ.



## ක්‍රියාකාරකම 01

i. මෙම පාඩම හොඳින් කියවන්න.
இப் பாடத்தை நன்றாக வாசிக்கவும்.

ii. එක් එක් අවස්ථාව පිළිබඳ ව විශේෂ අවධානයකින් යුතු ව නැවත කියවන්න.
ஒவ்வொரு சந்தர்ப்பங்கள் தொடர்பாக முக்கிய கவனம் செலுத்தி மீண்டும் வாசிக்கவும்.

## ක්‍රියාකාරකම 02

i. පාඩමේ ඇතුළත් වීර ක්‍රියාව අනුපිළිවෙළින් විස්තර කරන්න.
பாடத்தில் அடங்கும் வீரச் செயற்பாடுகளை ஒழுங்குமுறையாக விளக்குக.

ii. එය අභ්‍යාස පොතේ ලියන්න.

## ක්‍රියාකාරකම 03

ධීර වෙනුවෙන් පාසලේ පැවැත්වූ උත්සවය හා එහි දී ඔහුට ලැබුණු තෑගි පිළිබඳ ව කෙටියෙන් ලියන්න.
டீரவுக்காக பாடசாலையில் நடைபெற்ற நிகழ்வு பற்றியும், அங்கு அவனுக்குக் கிடைத்த பரிசு பற்றியும் சுருக்கமாக எழுதுக.

## ක්‍රියාකාරකම 04

පහත සඳහන් එක් අවස්ථාවක් ගැන කෙටි වාක්‍ය 10ක් ලියන්න.

i. ඔබ කෙනකුට කළ උපකාරයක්
நீர் ஒருவருக்குச் செய்த ஓர் உதவி.

ii. විපතක දී පිහිට වීමක්
அனர்த்தமொன்றின் போது உதவுதல்.

iii. අසරණ සතකු මරණයෙන් ගලවා ගැනීමක්
அனாதரவான விலங்கு ஒன்றை மரணத்தில் இருந்து விடுவித்தல்.

## ක්‍රියාකාරකම 05

i. ඔබ ධීර යයි සිතන්න. විපතට පත් ජීවිත බේරා ගැනීම පිළිබඳ අත්දැකීම ඔබේ වචනයෙන් විස්තර කරන්න.
நீங்கள் உங்களை டீர என நினைத்துக் கொள்ளுங்கள். அனர்த்தத்துக்கு உட்பட்டு உயிரைக் காப்பாற்றிக் கொள்வது தொடர்பான அனுபவத்தை உங்கள் வசன நடையில் விளக்குக.